# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2046/2 - 2017 නොවැම්බර් මස 20 වැනි සඳුදා - 2017.11.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* KDS/PAN/04/04/02/10.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 13/2000/FR/63.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පලිස්පත්තු බටහිර කෝරළේ, බැද්දේගම ගමේ පිහිටි, මිනින්දෝරු අධිකාරි විසින් සකස් කරන ලද මු.පි. මහ 6682 දරන 2017.05.24 දිනැති පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 20.3065 ක් වූ කැටල්ඔයවත්ත ඉඩම් කොටසට මායිම්:

*උතුරට* : එච්. ජී. ටී. ගුණතිලක හිමිකම් කියන කැටල්ඔයවත්ත (හි.පි. 49972) සහ පේරගොල්ල ඔය.

*නැගෙනහිරට* : පේරගොල්ල ඔය සහ මු.පි.මහ 6137 හි කැබලි අංක 1

*දකුණට* : මු. පි. මහ 6137 හි කැබලි අංක 1 සහ එස්. කේ. ගුණතිලක හිමිකම් කියන කැටල්ඔය වත්ත (හි. පි. 49972).

*බටහිරට* : එස්. කේ. ගුණතිලක හිමිකම් කියන කැටලඔය වත්ත (හි. පි. 49972) සහ එච්. පී. ටී. ගුණතිලක හිමිකම් කියන කැටලඔය වත්ත (හි. පි. 49972).

හිමිකම් කියන්නා:

එච්. ජී. එම්. ගුණතිලක මහතා,
අංක 11, ඩී. එස්. සේනානායක වීදිය,
මහනුවර.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 22 වැනි දින පෙ. ව. 9.30 ට පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

එදිනට ඔප්පු, පත්ඉරු සටහන් හා අනෙකුත් ලියවිලි ඉදිරිපත් කළ යුතු ය.

තව ද, 2017 දෙසැම්බර් මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජේ. පී. යූ. කේ. ජයරත්න,
ප්‍රාදේශීය ලේකම් ,
පන්විල කොට්ඨාසය.

2017 නොවැම්බර් මස 15 වැනි දින,
පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-10

1A - G 26620 - 17 - (2017/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.